# ඉංගිරිසියෙන් එළොව පොල් දැකීම

පොල් වැටන්නේ මිනිසුන් පොල් වැටීමක් ගැන සිතන නිසා යැයි කී විට එසේ කීම විකාරයක් බව ඇතැමකු කියනු ඇත. පොල් වැටීමක් ගැන නොසිතන්නේ නම් පොල් නොවැටී ගසේ ම රැඳෙන්නේ දැයි එවැන්නකු පණ්ඩිතමානී අතුරු ප්‍රශ්නයක් ඇසීමට ද ඉඩ ඇත. ඇතැම් භෞතිකවාදීන් සිතන්නේ (සිංහල බෞද්ධයෝ භෞතිකවාදියෝ හෝ විඥානවාදියෝ හෝ නොවෙති.) ඔවුන්ට තරම් වෙනත් අයට ලෝකයට තේරුම් ගත නොහැකි බව ය. භෞතිකවාදය තරම් තේරුම්ගැනීමට පහසු දෙයක් නැත. අප සිතුවත් නැතත් පොල් ගෙඩි වැටෙන බව කීම කිනම් කප්පක් ද? ඉතා සීමිත බුද්ධි මට්ටමක සිටින අයකුට වුව ද එය තේරුම් ගත හැකි ය. විඥානවාදියකු වීමට එයට වඩා බුද්ධිමට්ටමක් අවශ්‍ය වෙයි. විඥානවාදියකු හෝ භෞතිකවාදියකු හෝ නොවී සිටීමට ඉහළ බුද්ධිමට්ටමක් අනිවාර්ය වෙයි.

පොල් වැටෙන්නේ මිනිසුන් පොල් වැටීමක් ගැන සිතන නිසාය යන්නෙහි තේරුම කුමක් ද? පොල් ගැන, පොල්වල ඇති ගුණ, පොල් ගෙඩියක් ලෙලි ගසා පොලය බිඳ පොල් ගා ගත හැකි බව නොදන්නා සංස්කෘතියක මිනිසුන් සම්බන්ධයෙන් ගත්කල පොල් වැටීමේ දී සිදුවන්නේ කුමක් ද? ඔවුන්ට අනුව යම් ගෙඩි වර්ගයක් වැටන්නේ යැයි සිතමු. එහෙත් ඒ ගෙඩිය යන්න ද අපේ ගෙඩිය නොවේ. ගෙඩිය යන්න ද සංස්කෘතියෙන් ස්වායත්ත නොවේ. ඉංගිරිසියෙන් නට් යැයි කියන්නේ ගෙඩිවලට නොවන බව තේරුම් ගැනීම තරමක් අපහසුවන්නේ භෞතිකවාදී නට්කාරයන්ට විය හැකි ය. coconut යන ඉංගිරිසි වචනයෙන් පොල් ගෙඩියක් කියැවෙන්නේ යැයි සිතමු. පොල් ගසට ඉංගිරිසියෙන් කියන්නේ coconut tree මිස coco tree නොවේ. එමෙන් ම අපි සිංහලෙන් පොල්ගසට පොල් ගෙඩි ගස යැයි නොකියමු. සිංහලයාගේ පොල් ගෙඩිය තරමක් හෝ සමාන වනු ඇත්තේ කේරළ වැසියන්ගේ "පොල් ගෙඩියට ය".

එසේ නම්, ඉන් කියැවෙන්නේ කිසිම දෙයක් නොවැටෙන් බව දැයි යමකු ඇසීමට ඉඩ ඇත. එසේ සිතන්නේ, අසන්නේ වැටීම යන්න සංස්කෘතියෙන් ස්වායත්ත යැයි හෝ මනසින් ස්වායත්ත යැයි හෝ ඇතැමුන් සිතන නිසා ය. නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය ගැන දන්නා අයකුට වැටීම යන්න ගුරුත්වය සමග බැඳී ඇත. අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය ගැන දන්නා අයට යමක් වැටෙන්නේ අවකාශ කාලයේ වක්‍රතාවය හේතුකොටගෙන ය. ඒ කිසිවක් නොදැන සිටි ගැලීලියෝ විද්වතා වැටීම ගැන සිතුවේ කෙසේ ද? ඔහුට සහ ඔහුගේ මිතුරන්ට වැටීම යනු කුමක් වී ද? ඉතාලියේ පීසා නුවර ඇලවෙන කුළුණින් යම් වස්තු අත්හැර ගැලීලියෝ පඬිවරයා (හෝ ඒ පරීක්ෂණය කෙළේ යැයි කියන ඔහුගේ මිතුරා හෝ) පෙන්නුම් කෙළේ පොළොවට වැටෙන වස්තු පොළොව ආසන්නයේ දී එකම නියත ත්වරණයකින් වැටෙන බව ය. (පොළොව ආසන්නයේ දී වස්තු වැටෙන ත්වරණය පොළොවෙන් ඈතට ගිය විට වස්තු වැටෙන ත්වරණයට වඩා අඩු බව ගැලීලියෝ විද්වතාට දැනගැනීමට ක්‍රමයක් නොතිබුණි. ඒ බව අද භෞතික විද්‍යාව හදාරන අය දන්නේ නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ඇසුරෙනි.) ගැලීලියෝ විද්වතා ඇතුළු එවකට සිටි යුරෝපීය බුද්ධිමතුන් වැටීම යන්න දුටුවේ, එනම් ඉන් අදහස් කෙළේ, එකම නියත ත්වරණයකින් වස්තු පොළොවට ආසන්නයේ වැටීම ය.

ගැලීලියෝ පඬිවරයාට පළමුව යුරෝපයේ වැටීම යන්නට එවැනි ප්‍රවාද හා සංකල්ප මුසු වී නොතිබුණි. ඉන් කියැවෙන්නේ එයට පෙර සංකල්ප නොතිබූ බව නොවේ. වැටීම යන්න ම සංකල්පයකි. කලින් සඳහන් කර ඇති ආකාරයට එයට අවකාශය කාලය ආදී සංකිර්ණ සංකල්ප අවශ්‍ය වෙයි. වැටීම යනු බොහෝ ඈත කාලයක ජීවත් වූ යුරෝපීයයයනට යම් දෙයක් (ගෙඩියක්, ගල්කැටයක්, පොතක්, පෑනක් ආදී වශයෙන්) පොළොවෙන් තරමක් ඈත පිහිටි තැනක සිට පොළාව දෙසට ගමන් කිරීම ය. මේ කරුණුවලින් පැහැදිලි වන්නේ අප එකිනෙකා වැටීම යන්න තේරුම් ගන්නා ආකාර විවිධ බව ය. එනම් අප එකිනෙකා වැටීම යන්න දකින ආකාරය වෙනස් බව ය. අප ඒ ඒ ආකාරයට වැටීම දකින්නේ ඒ ඒ ආකාරයට වැටීම ගැන සිතන නිසා ය.

බළලකු හෝ බල්ලකු හෝ පොල් ගෙඩියක් වැටෙනු නිරීක්ෂනය කරන්නේ කෙසේ ද? බළලා, බල්ලා හෝ වෙනත් සතකු එය යමක් වැටෙන ආකාරයෙන් නිරීක්ෂනය කරන්නේ ද? එයට පිළිතුර අපි නොදනිමු. එහෙත් සත්තු ද එහි දී යම් කිසිවක් නිරීක්ෂනය කරති. කැමරාවකට නම් එලෙස කිසිවක් නිරීක්ෂනය නොවන බව කිව හැකි නමුත් සිත් පිත් ඇති සතුන් ගැන එසේ කිව හැකි නොවේ. සතුන්ට ද මිනිසුන්ට මෙන් මනස් ඇතැයි සිංහල බෞද්ධයෝ විශ්වාස කරති.

© Prof. Nalin De Silva

එහෙත් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි එසේ නොවේ. බටහිරයෝ සාමාන්‍යයෙන් ගත්කල සතුන්ට මනස් ඇති බව නොපිළිගනිති. එයට හේතුව බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතීන්හි මිනිසා පමණක් දෙවියන් වහන්සේ විසින් උන්වහන්සේගේ ස්වරූපයෙන් මවනු ලැබී ඇති බැවින් ය. එහෙත් සතුන්ට ද සංස්කෘතීන් හා මනස් ඇති බව පිළිගැනීමට දැන් දැන් බටහිර විද්‍යාඥයන්ට ද සිදු වී තිබේ.

අප පොල් ගෙඩියක් වැටීම යන්නෙන් කියැවෙන්න හෝ ඒ හා අදාළ නිරීක්ෂන බළලකු හෝ බල්ලකු හෝ කිනම් ආකාරයෙන් නිරීක්ෂනය කළ ද, එහි දී වැදගත් වන්නේ බළලා හෝ බල්ලා හෝ ඒ පිළිබඳ සිතන ආකාරය ය. බළලා නිරීක්ෂනය කරන්නේ බලලා සිතන දේ මිස වෙනත් දෙයක් නොවේ. බළලාගේ නිරීක්ෂනය බලලාගේ සිතීමෙන් වෙන්කළ හැකි නොවේ. බළලා එහි දී කුමක් නිරීක්ෂනය කළ ද ඌ එසේ කරන්නේ ඌ එසේ සිතන බැවිනි. බළලා කැමරාවක් මෙන් කිසිවක් නොසිතන්නේ නම් ඌ කිසිවක් නිරීක්ෂනය නොකරයි.

මෙහි දී තවත් කරුණක් වැදගත් වෙයි. අප පොල් ගෙඩියක් වැටෙන්නේ යැයි කියන දෙය ම බළලා වෙනත් ආකාරයකින් නිරීක්ෂනය කරන බවක් මෙහි දී නොකියැවෙන බව අවධාරණය කළ යුතු ය. අදාළ නිරීක්ෂන යනුවෙන් ඉහත සඳහන් කර ඇත්තේ මේ වෙනස පැහැදිලි කිරීමට ය. අප පොල් ගෙඩියක් වැටෙන්නේ යැයි කියන්නේ ඉංගිරිසි ජාතිකයකු (ඉංගිරිසි කතා කරන ඕනෑම අයකු නොව ඉංගිරිසි සංස්කෘතිය තුළ ජීවත් වෙමින් ඉංගිරිසි ජාතියට අයත් ව ඉංගිරිසි කතා කරන්නකු) අ කොකනට් ෆෝල්ස් (a coconut falls) යැයි කියන්නට නොවේ. සුද්දාගේ කොකනට් යනු අපේ පොල් නොවේ. අපට එලොව පොල් පෙනිය හැකි නමුදු සුද්දන්ට කොකනට් පෙනීමට එලොවක් නැත. ඔවුන්ට වැඩිම වුවහොත් කිව හැක්කේ ස්වර්ගයේ කොකනට් (coconut in heaven) ගැන ය. එවැනි ප්‍රකාශනයකින් ඉංගිරිසි ජාතිකයකුට කිසියම් දෙයක් සන්නිවේදනය වන්නේ යැයි සිතිය නොහැකි ය.

පොල් ගෙඩියක් වැටෙනවා යන්නෙන් අප කියන දෙය ම ඉංගිරිසින් ඉංගිරිසියෙන් නොකියැවෙනවා පමණක් නොව ඒ ප්‍රකාශ දෙකම ඔබ්බෙන් වූ යමක් ඇත්තේ ද නැත. සොසියුර් පඬිවරයා වචන සම්බන්ධයෙන් ප්‍රඥප්තය (referent) යන්න මගින් එවැන්නක් තිබෙන බව උපකල්පනය කෙළේ ය. ගවයා හා බුල් යන්නෙන් කියැවෙන දේ වෙනස් වුව ද ඒ දෙකට ම ඔබ්බෙන් වූ ප්‍රඥප්තයක් ඇතැයි ඔහු විශ්වාස කෙළේ ය. එය වැරදි ය. එමෙන් ම භාෂාවේ ප්‍රකාශ (වාක්‍ය ආදී වශයෙන්) මගින් කියැවෙන දේ භාෂාවෙන් භාෂාවට වෙනස් වුව ද ඒ ප්‍රකාශ ඔබ්බෙන් ඇති යමක් ඇතැයි ගැනීම වරදකි. එසේ ගැනීම හුදු උපකල්පනයක් පමණකි.

බළලුන් පොල් වැටෙන විට කුමක් සිතුව ද, ඒ අප පොල් වැටීම යනුවෙන් සිතන දෙය නොවේ. එමෙන්ව ම අපට ද ඉංගිරිසි ජාතිකයන්ට ද, බළලුන්ට ද පොදු වූ යමක් ඒ සියළු නිරීක්ෂනවලට ඔබ්බෙන් ඇතැයි කීම ද වැරදි ය. එසේ තිබේ නම් ඒ ඇති දෙය කියන්නේ කිනම් බසකින් ද? ඇත්තේ යැයි කියන දෙය බසකින් ප්‍රකාශ කිරීමට ගිය විට නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදුවෙයි. වෙනත් බසකින් ඒ ඇතැයි යනුවෙන් පවසන දෙය ප්‍රකාශ කරන්නේ කෙසේ ද? වෙනත් බසකින් ප්‍රකාශ කළ විට සංස්කෘතික වෙනස්කම් හේතුවෙන් එකම දෙයක් ප්‍රකාශ නොවෙයි. එසේ නම් ඒ ප්‍රකාශවලට ඔබ්බෙන් වූ යම් කිසිවක් තිබේ ද? එය එසේ නම් ඒ ඇතැයි කියන දේ ප්‍රකාශ කරන්නේ කෙසේ ද? මෙහි කෙළවරක් නැත. මෙවැනි ක්‍රියාවලියකින් ගත හැකි දෙයක් නැත. එය කෙළවරක් නැතිව පස්සෙන් පස්සට යෑමකි. එවැන්නකට අනන්ත ප්‍රතික්‍රමණයක් (infinite regression) යැයි කියනු ලැබේ.

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ අප දකින අසන දෑ, එනම් නිරීක්ෂනය කරන දෑ ඔබ්බෙන් වූ යමක් ඇතැයි කිව නොහැකි බව ය. එසේ ඇතැයි ගත්ත ද, එය නිරීක්ෂනය කළ හැකි නොවේ. එයට හේතුව නිරීක්ෂනය කිරීමට සිදුවන්නේ මනස ඇසුරෙන් වීම ය. භාෂාවෙන් ප්‍රකාශ කිරීමට නොහැකි යමක් සිතුවමකින් හෝ සංගිත ඛණ්ඩයකින් හෝ ප්‍රකාශ කළ හැකි යැයි යමකු සිතුව ද ඒ ඒ චිත්‍රවලින්, සංගීත ඛණ්ඩවලින් ප්‍රකාශවන දෑ ඒ ඒ සංස්කෘතීන් ගැන අවබෝධයක් නොමැතිව තේරුම් ගත නොහැකි ය. එවිට ඒ තේරුම් ගත හැකි වන්නේ ඒ නිර්මාණය කෙරුණු සංස්කෘතියෙහි නොව වෙනත් සංස්කෘතියක ය. සංස්කෘතීන්හි ඇති ප්‍රශ්නය නම් ඒ ඒ සංස්කෘතීන්හි ලබන පුහුණුවකින් තොරව ඒ ඒ සංස්කෘතියෙහි නිර්මාණය වන දේ තේරුම් ගැනීමට නොහැකි වීම ය. රාගධාරී සංගීතය ගැන ලබන පුහුණුවකින් තොරව ඒ සංගීතයෙන් ඇතිවන භාවප්‍රකාශ තේරුම් ගතහැකි නොවේ. එක්ස් රේ ඡායාරූප හා එහි අර්ථකථන පිළිබඳ පුහුණුවකින් තොරව රෝගියකුගේ ශරීරයේ එක්ස් කිරණ රූපයක් තේරුම් ගත හැකි

© Prof. Nalin De Silva

නොවේ. ඒ තේරුම් ගැනීම සඳහා බටහිර වෛද්‍ය විද්‍යාවේ ඇතැම් සංකල්ප හා බටහිර භෞතික විද්‍යාවේ ඇතැම් සංකල්ප ගැන යම් අවබෝධයක් තිබිය යුතු ය.

සංස්කෘතියකින් තොරව ප්‍රකාශ කළ හැකි දෙයක් ගැන කතා කිරීම නිශ්ඵල වුවකි. එහෙත් භෞතිකවාදීන් යැයි කියාගන්නා පුද්ගලයෝ අධිභෞතික එසේත් නැතිනම් පාරභෞතික (metaphysical) සංකල්පවලට පහර දෙමින් ඉතාමත් පාරභෞතික වූ යථාර්ථයක් ගැන විශ්වාස කරති. එය විශ්වාසයක් මිස වෙනත් දෙයක් නොවේ. ඊනියා යථාර්ථයක් ගැන විශ්වාසය තැබීම දෙවියන් වහන්සේ ගැන විශ්වාසය තැබීම වැනි ය. යථාර්ථය ගැන විශ්වාසයක් බටහිර සංස්කෘතීන්හි ඇත්තේ ම ඒ සංස්කෘතීන්හි එවැනි යෙහෝවා නම් විස්තර කළ නොහැකි දෙවියන් වහන්සේ කෙනකු ගැන විශ්වාසයක් ඇති බැවිනි.

මේ යථාර්ථ කිසි දිනෙක ප්‍රත්‍යක්ෂයෙන් දතහැකි දේ නොවේ. බුදුන් වහන්සේ ප්‍රත්‍යක්ෂය ගැන අවධාරනය කෙළේ ඇයි ද යන ප්‍රශ්නය මීළඟට සැලකිල්ලට ගත යුතු ය. ප්‍රත්‍යක්ෂ යනු ද අවසාන වශයෙන් ගත්කල ඉන්ද්‍රිය ගෝචර වෙයි. ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ ගැන අපට විශ්වාසයක් තැබිය හැකි ද? එය වැදගත් ප්‍රශ්නයකි. එහෙත් මෙහි දී අවධාරණය කෙරෙන්නේ වෙනත් කරුණකි. ඉන්ද්‍රිය ගැන ද විශ්වාසයක් තැබිය නොහැකි නම් ඉන්ද්‍රියවලට ඔබ්බෙන් වූවක් ගැන විශ්වාසය තබන්නේ කෙසේ ද? අවසානයේ දී සියල්ල විශ්වාසය මත රඳා පවතියි. යථාර්ථ ගැන මෙන්ම ප්‍රත්‍යක්ෂ ගැන ද ඇත්තේ විශ්වාස පමණකි. ප්‍රත්‍යක්ෂ නොවන යථාර්ථයක් ගැන විශ්වාසයක් නැති තැනැත්තා ප්‍රත්‍යක්ෂ ගැන ද විශ්වාසයක් ඇති කරගත යුතු නොවේ. එහෙත් යමකුට එතැනට ළඟා වීමට හැක්කේ ප්‍රත්‍යක්ෂ ඔස්සේ ය. ප්‍රත්‍යක්ෂ ගැන ඇති විශ්වාසය ද නැති කරගැනීමට ප්‍රත්‍යක්ෂ ආධාර කර ගත යුතු ව ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva